වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් - 2021
නුවරඑළිය දිස්ත්‍රික්කය

வருடாந்த செயலாற்றுகை அறிக்கையும் கணக்குகளும் - 2021
நுவரெலியா மாவட்டம்

Annual Performance Report & Accounts – 2021
Nuwara Eliya District



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය
மாவட்ட செயலகம் - நுவரெலியா
District Secretariat –Nuwara Eliya

Annex:I

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නුවරඑළිය

වැය ශීර්ෂ අංකය - 260

අන්තර්ගතය

පරිච්ඡේද 01 - ආයතනික පැතිකඩ

පරිච්ඡේද 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේද 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේද 04 - කාර්ය සාධන දර්ශකය

පරිච්ඡේද 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේද 06 – මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේද 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 දිස්ත්‍රික් මායිම් හා භූගෝලීය පසුබිම

ශ්‍රී ලංකාවේ පියස්ස යැයි විරුදාවලි ලබන නුවරඑළිය දිස්ත්‍රික්කය මහනුවර, බදුල්ල, කෑගල්ල, හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්ට මායිම්ව, මධ්‍යම පලාතේ පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට අඩි 900 සිට අඩි 8000 දක්වා උසට විහිදී යන ශ්‍රී ලංකාවේ උසම කන්ද වන පිදුරුතලාගල කන්ද මෙන්ම කිරිගල් පොත්ත කන්ද, කොටුපොල කන්ද , කිකිළියාමාන කන්ද, ග්‍රේඩ් වෙස්ටන් කන්ද ,හග්ගල කන්ද හා අති පූජණීය සමනල කන්ද ආදී කඳු පන්තිද නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.

එසේම ලක්ෂපාන ඇල්ල, ඩෙවෝන් ඇල්ල, ඇල්ජින් ඇල්ල, සෙන්ට් ක්ලේයා ඇල්ල, රම්බොඩ ඇල්ල, බේකස් ඇල්ල, කුරුඳු ඇල්ල, ගැරඩ් ඇල්ල ආදියත් මහවැලි හා කැළණි ගංගාවල ආරම්භයත් එසේම දෙස් විදෙස් ප්‍රචලිත හෝර්ටන් තැන්න අභය භූමියත්, හග්ගල උද්‍යානයත් මෙහි පිහිටා තිබීම සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හේතුවී තිබේ. එසේම ශ්‍රී ලංකාවේ ජලවිදුලි බල උත්පාදනයට ප්‍රමුඛත්වයක් ගන්නා මාවුස්සා කැලේ, කාසල්රී, කැනියොන්, නෝර්ටන්බ්‍රිජ්, කොත්මලේ,රන්දෙණිගල යන ජලාශද, වික්ටෝරියා ජලාශයෙන් වැඩි කොටසක්ද පිහිටා ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළය.

ජනගහනයෙන් 57.1% ක් පමණ ශ්‍රී ලංකා දෙමළ වන අතර, ඉතිරිය සිංහල හා අනෙකුත් ජාතීන්ගෙන් සමන්විත වේ. දිස්ත්‍රික්කයේ පවතින විශේෂිත දේශගුණික තත්වය කෘෂි කර්මාන්තයට හිතකර වන අතර වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ එළවළු බෝග වගාව සඳහාය.

වර්ග කිලෝ මීටර් 1741 ක විශාලත්වයකින් යුක්ත මෙම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වර්ෂාපතනය අගල් 75 ක් පමණ වන අතර, ලංකාවේ වැඩිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශය (වටවල) මෙන්ම අවම උෂ්ණත්වය වාර්තා වන ප්‍රදේශයද (නුවරඑළිය) මෙම දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබීම විශේෂත්වයකි.



1.1.2 දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම හා එහි වැදගත්කම

ක්‍රි.ව. 1819 දී ඉංග්‍රිසි ජාතික ජෝන් ඩේවි විසින් නුවරඑළිය සොයා ගැනීමේ ඓතිහාසික සිද්ධියෙන් පසු පුංචි එංගලන්තය යන විරුදාවලියෙන් නුවරඑළිය හඳුන්වනු ලැබිණ. ස්වකීය සුඛවිහරණය පිණිස බෝග වගාවටත්, සංචාරක මධ්‍යස්ථානයක් ලෙසත් ඉන් අනතුරුව පරිපාලන ඒකකයක් ලෙසත් නුවරඑළිය සුදු ජාතිකයන්ගේ ආදරය දිනා ගත් දෙවන මව් බිමක් බවට පත්විය. ඒ සඳහා හේතු වූයේ නුවරඑළියේ පැවැති දේශගුණික තත්ත්වයන් සිය මව් රටේ දේශගුණික තත්ත්වයන් හා සමපාත වීමයි.

ඒ නමුත්, ජනප්‍රවාද හා ලේඛන ගත ඓතිහාසික සාධකයන්ට අනුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවේ. ඒ සඳහා හෝටන් තැන්න සුවිශේෂී පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථානයක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම කඳුකරයේ ජනාවාස ව්‍යාප්තව පැවැති එක් කලාපයක් ලෙස හෝටන්තැන්න පුරාවිද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට ලක්වූ ප්‍රදේශයකි.

ශ්‍රී ලංකාදීපයේ ඉඩයිම් පොතට අනුව රුහුණු, මායා, පිහිටි යන ත්‍රිසිංහලයේ රුහුණු රටට අයත් රටවල් 42ක් වූ බවත්, කොත්මලේ රට, මතුරට, ගොඩ රට, සගම, කටුබුළු රට, මීනිපේ යන රටවලින් කිහිපයක් නුවරඑළියට අයත් බවත් එහි සඳහන් වේ.

වර්තමානයේ නුවරඑළිය තේ වගාවෙන් පිරි වාණිජමය ස්වරූපයක් ගත්තේ වී නමුත්, පුරාණයේ අලි ඇතුන්ගෙන් පිරි වනාන්තරයක් වූ බව කියැවේ. වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය, මස්කෙළිය යන මැතිවරණ කොට්ඨාශයන්ගෙන් සමන්විත කන්ද උඩරට තෙත්බිම වූයේ නුවරඑළිය දිස්ත්‍රික්කයයි. පුරාණ රජවරු මෙම කලාපය සංකීර්ණ ජනාවාස බවට පත් නොකරනු ලැබුයේ ආරක්ෂක භූමියක් ලෙසත්, වර්ෂාපතනය සහිත ජලජ මූලාශ්‍රයක් ලෙසත් භාවිතයට ගැනීම නිසාවෙනි.

ඓතිහාසික සාධක හමු නොවන මුත්, රාවණා පුරාවෘත්තයට නුවරඑළියේ ඉතිහාසය සම්බන්ධයෙන් විශේෂ ස්ථානයක් හිමි වේ. ජනප්‍රවාදවලට අනුව, ප්‍රාග් ඓතිහාසික යුගයේ රාවණ රජු බදුලු ප්‍රදේශය සිය අගනුවර කර ගත් බවත්, එම පාලන ප්‍රදේශයට නුවරඑළිය අයත් වූ බවත්, රාවණ රජු සීතාවන් පැහැර ගෙන පැමිණීමෙන් පසු ඇය වලපනේ පරණගම ප්‍රදේශයේ එනම්, වර්තමාන රන්දෙණිගල ජලාශ්‍රයට යටවී ඇති ස්ත්‍රීපුර කන්දේ ගල්ගුහාවක සඟවා තැබූ බවත් කියැවේ. එහි වාතාශ්‍රය හා හිරු එළිය නොලැබීම හේතුවෙන් සීතා දේවියට ඇස් රෝගයක් හට ගැනින. එබැවින් ඇය හිරු එළිය දැකීම පිණිස රැගෙන ආ ප්‍රදේශය සීතා එලිය වූ බවත්, මේ දරුණු වියෝගයෙන් සීතාවන් වැළපුණු ප්‍රදේශය වලපනය වූ බවත් ජනප්‍රවාදයේ එයි.

එසේම විජය රජු විසින් කුවේණිය පළවා හැරීමෙන් පසු ඇය සිය දරු දෙදෙනා සමඟ පලාවිත් කොත්මලේ දොරගල හා යකිනිගල ප්‍රදේශවල වාසය කළ බව කියැවෙන තවත් ජනප්‍රවාදයක් වේ. යක්ෂ ගෝත්‍රිකයන් විසින් ඇය මරා දැමීමෙන් පසු ඇයගේ දරු දෙදෙනා සමනල අඩවිය වෙත පළා ගොස් දිවි ගෙවූ බවත්, ඔවුන්ගෙන් වැදි ජනතාව පැවැත එන බවත් තවදුරටත් විස්තර වේ.

හඟුරන්කෙත, වලපනේ, කොත්මලේ ප්‍රදේශය ඓතිහාසික ලේඛන ගත සාක්ෂි සහිත නිශ්චිත ඉතිහාසයකට උරුමකම් ඇති ප්‍රදේශයන්ය. මෙම ප්‍රදේශ ආශ්‍රිතව විවිධ ස්ථාන නාම ඓතිහාසික සංසිද්ධීන් හා නිතරතුරුවම සාකච්ඡා වී තිබීම ඊට කදිම නිදර්ශන වේ. අනුරාධපුර නගරය ආරම්භ කළ පණ්ඩුකාභය කුමරු සිය යුද්ධ සංවිධාන කටයුතුවල දී දොළඟල ප්‍රදේශය යොදා ගත් බව මහාවංශයේ සඳහන් වේ. එම ස්ථානය හඟුරන්කෙත දොළඟල ප්‍රදේශය විය හැකි බව විශ්වාස කෙරේ.

එසේම දුටුගැමුණු රජු හා කොත්මලේ ප්‍රදේශය ගැනද පවතින්නේ සුවිශේෂී ඉතිහාසයකි. දුටුගැමුණු කුමරු සිය රාජාභිෂේකයට ප්‍රථම ශ්‍රී ලංකාද්වීපය එක්සේසත් කරනු පිණිස එළාරට විරුද්ධව සේනා සංවිධානය කරනු ලැබුයේ කොත්මලේ ප්‍රදේශයේ රැදෙමිනි. එසේම කාවන්තිස්ස රජතුමා විසින් සුපුල්පිටිය විහාරයේ සතලිස් මහාබෝධි අංකුරයක් රෝපණය කළ බව කියැවේ.

ක්‍රි. පූ. 103 දී වළගම්බා රජු තමා වෙත එල්ල වූ සතුරු ආක්‍රමණ හමුවේ වලපනේ ප්‍රදේශයට පළා ආ රජු ආරක්ෂාව පිණිස රැඳී සිටි සමයේ යටිමාදුර, විල්වල, අරත්තන, කඩදොර වැනි රජ මහා විහාර කරවා ඇති බව මහාවංශයේ සඳහන් වේ. පොළොන්නරු යුගයේ විජයබාහු රජතුමා ශ්‍රී පාදස්ථානයේ හා ශ්‍රී පාද වන්දනා කරනු ලබන මඟීන්ගේ නඩත්තුව සඳහා ගම්වරයක් ලබා දී ඒ බව අඹගමුවේ සෙලක කොටවා ලේඛන ගත කර තිබේ. වර්තමානයේ අඹගමුව සෙල්ලිපිය නමින් හඳුන්වන්නේ එම ලිපියයි.

එසේම ක්‍රි.ව. 1215 – 1236 දක්වා පොළොන්නරු රාජධානි සමයේ කාලිංග මාඝ ආක්‍රමණයත් සමඟ වෙහෙර විහාර විනාශ කිරීම හේතුවෙන් වාචිස්සර හිමියන් ප්‍රමුඛ භික්ෂූණ් වහන්සේලා දළදාව හා පාත්‍රා ධාතූන් වහන්සේලාගේ ආරක්ෂාව පතා කොත්මලේ ප්‍රදේශයට වැඩම කරවූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ.

දඹදෙණි යුගයේ දී තුන්වන විජයබාහු රජතුමා දළදා වහන්සේගේ ආරක්ෂාව පතා බෙලිගල ප්‍රදේශට වැඩම කරවූ බව සඳහන්ය. නැවත දළදා වහන්සේ සිය රාජධානියට වැඩම කරවීමට පැමිණි විජයබාහු රජු නවාතැන් ගත් ස්ථානය දිඹුල කන්ද වර්තමානයේ විජේබාකන්ද ලෙසත්, පෙරහැර නියම කරගත් ගම්දොර නියම්ගම්දොර ලෙසත්, පෙරහැරට මල් සපයාගත් ගම මල්දෙණිය ලෙසත් ව්‍යවහාරයට පැමිණ ඇති බව ප්‍රදේශවාසීන්ගේ විශ්වාසයයි. එසේම සීතාවක රාජසිංහ රජු ශිව ආගම වැළඳ ගැනීමෙන් පසු අරිටියකී වෙන්ඩු පෙරුමාල් වෙත කොත්මලේ ප්‍රදේශය පවරා දුන් බව කියැවේ.

කන්ද උඩරට ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වීමෙන් අනතුරුව නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් වලපනේ, කොත්මලේ, හඟුරන්කෙත යන ප්‍රදේශ ක්‍රමයෙන් ජනාවාස බවට පත්විය. එම ප්‍රදේශ රජුගේ සෘජු පාලනයට යටත් දිසාවන් බවට පත් වූ බව ඓතිහාසික සාක්ෂි අනුව පැහැදිවේ. විලමධර්මසූරිය රජුට වලපනේ ප්‍රදේශය පෘතුගීසීන්ගෙන් ආරක්ෂා සැපයූ ආරක්ෂක මධ්‍යස්ථානයක් විය. පසුව රජු එහි වූ මළුවේගොඩ රජමහා විහාරය ප්‍රතිසංස්කරණ කළ බවත්, එතුමා විසින් මාළිගාතැන්නෙහි රජ මාළිගයක් ඉදිකළ බවත් ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. ක්‍රි.ව. 1635 – 1687 දක්වා රජ කළ දෙවන රාජසිංහ රජතුමා හට ද කොත්මලේ හරංගල, වලපනේ රාසිංගල ප්‍රදේශය ආරක්ෂා සැපයූ ප්‍රදේශ වශයෙන් සඳහන් වන අතර, එවකට දියතිලක පුරය ලෙසින් හැඳින්වූ මෙම ප්‍රදේශය හඟුරන්කෙත ලෙස ව්‍යවහාරයට ලක් කරනු ලැබුයේ මෙම රජතුමා විසින් බව කියැවේ. ක්‍රි. ව. 1744 – 1782 දක්වා රජ කළ කීර්ත්‍රි ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ඕලන්ද ආක්‍රමණවලින් ආරක්ෂා කිරීම පිණිස හඟුරන්කෙත අරත්තන රජමහා විහාරයේ දළදා වහන්සේ සඟවා තැබූ බවත්, ඉන් පසු එම විහාරය මුල් කර ගනිමින් දළදා වහන්සේට පූජෝපහාරයක් ලෙස පෙරහැරක් ආරම්භ කළ බවත්, පසුව එම පෙරහැර හඟුරන්කෙත ඇසළ පෙරහැර වශයෙන් හැඳින් වූ බවත් සඳහන්ය. මෙම ප්‍රදේශයන් විටින් විට රජවරුන් වෙත ආරක්ෂා සැපයූ අතර අනු පරිපාලන ඒකක ලෙස පැවැති ආකාරය මන්දාරම්පුවත හා යටත් විජිත යුගයේ බ්‍රිතාන්‍ය ලේඛනවලින් හොඳින් තහවුරු වේ. 1803 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිය පරිවාර ස්ත්‍රීන් ද සමඟ හඟුරන්කෙත ප්‍රදේශයට පැමිණ මාළිගයක් කරවා එහි වාසය කළ බව සඳහන් වේ.

වර්ෂ 1818 දී ඉංග්‍රීසි ජාතිකයන්ට විරුද්ධව ඇති කරනු ලැබූ කැරැල්ලේ දී සර් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් වලපනේ දිසාපති තනතුරට දුල්ලෑව පත්කර එවීමෙන් අනතුරු සිංහල කැරලිකරුවන් විසින් අභිනව නිලධාරීයා පලවා හැර වලපනේ දිසාව නියෝජන කළ මොණර කොඩිය කැබලිවලට ඉරා විනාශ කළ බව සඳහන් වීමෙන් වලපනේ වෙනම පරිපාලන ඒකකයක් වශයෙන් මහනුවර රාජධානි සමයේ දී පැවැති බව තහවුරු වේ.

1.1.3 දිස්ත්‍රික් සිතියම



ඉඩම් පරිහරණය අනුව බිම් ප්‍රමාණය		
	ප්‍රමාණය(වර්ග කිලෝමීටර්)	ප්‍රතිශතය
ගොඩබිම් ප්‍රමාණය	1,690.2	97.08
අභ්‍යන්තර ජලාශ	50.8	2.92
මුළු බිම් ප්‍රමාණය	1,741.0	100.00
වගා කල මුළු බිම් ප්‍රමාණය	737.3	42.35
වගා නොකල මුළු බිම් ප්‍රමාණය	274.4	15.76
වනාන්තර මුළු බිම් ප්‍රමාණය	729.2	41.89
මුළු බිම් ප්‍රමාණය	1,741.0	100.00
මූලාශ්‍රය -දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය, නුවරඑළිය		

1.1.4 දිස්ත්‍රික්කයේ පොදු දත්ත

අනු අංකය	අවශ්‍ය දත්ත	සංඛ්‍යාව/වටිනාකම/ විස්තර	
01	දිස්ත්‍රික්කය	නුවරඑළිය	
02	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන	05	
03	සීමා නිර්ණය අනුව යෝජිත ප්‍රාදේශිය ලේකම් කාර්යාල සංඛ්‍යාව	10	
04	ග්‍රාම නිලධාරී වසම් ගණන	491	
05	ජනගහනය	780,000	
06	ජන්ද දායකයින් සංඛ්‍යාව	569,028	
07	නගර සභා	02	
08	මහනගර සභා	01	
09	ප්‍රදේශීය සභා ගණන	09	
10	පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන ගණන	08	
11	ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර	01	
12	පළාත් සභා මන්ත්‍රී සංඛ්‍යාව	17	
13	දිස්ත්‍රික් ජනතාවගේ ජීවනෝපාය/වෙළෙඳ රටාවන් (කෙටියෙන්)	වැවිලි කර්මාන්ත ආශ්‍රිත රැකියා හා කෘෂි කර්මාන්තය	
13 14	දිස්ත්‍රික්කයේ කාර්ය මණ්ඩලය	**අනුමත** 1,455	**සත්‍ය** 1,162
15	**සංචාරක බංගලා / නිවාඩු නිකේතන** ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ		1
16	**සංචාරක බංගලා / නිවාඩු නිකේතන** රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ		2

1.1.5 දිස්ත්‍රික් ජනගහන තොරතුරු

ස්ත්‍රී පුරුෂ භාවය මත (2020)



පුරුෂ	369,770
ස්ත්‍රී	403,396
එකතුව	773,116

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා අංශ අනුව ජනගහණය හා ජන ඝනත්වය - 2021

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ජනගහණය				වර්ග ප්‍රමාණය (ව. කි.මී.)	ජන ඝනත්වය (කිලෝ මීටර් 1 ට)
	නාගරික	ග්‍රාමීය	වතු	මුළු		
කොත්මලේ	-	68,612	42,287	110,899	225.0	493
හඟුරන්කෙත	-	82,441	14,591	97,031	229.0	424
වලපනේ	-	70,417	43,703	114,120	320.0	357
නුවරඑළිය	28,591	43,505	160,371	232,466	478.0	486
අඹගමුව	15,417	53,882	156,184	225,483	489.0	461
එකතුව	44,008	318,856	417,136	780,000	1,741	448

මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු

දැක්ම

ඵලදායි පුරවැසියෙක්,සතුටින් ජීවත්වන පවුලක්,විනය ගරුක සමාජයක් හා සෞභාග්‍යමත් දිස්ත්‍රික්කයක්.

මෙහෙවර

දිස්ත්‍රික් ජනතාවගේ අපේක්ෂාවන් මුදුන්පත් වන ආකාරයෙන් දිස්ත්‍රික්කයේ මානව හා භෞතික සම්පත් කළමනාකරණයේ පුරෝගාමියා ලෙස කටයුතු කරමින්,රාජ්‍ය අරමුදල් සැලසුම් සහගතව හා තිරසාරව ආයෝජනය කරවීම සහතික කිරීම සඳහා දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කරමින් අවශ්‍යතාවය මත උපදෙස් හා මඟ පෙන්වීම ලබාදීමත්,ජනතාවගේ ජීවනෝපාය,ග්‍රාමීය ආර්ථිකය නා සිටුවීම ඉලක්ක කරමින් ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතික ආර්ථිකයට ඉහල දායකත්වයක් ලබාදීම සහ එයට සමගාමීව දිස්ත්‍රික්කය තුළ සමාජ සහජීවනය හා සංහිදියාව ගොඩනැංවෙන අයුරින් අවශ්‍ය ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම.

අරමුණු

- පුද්ගලික හා රාජ්‍ය අංශයේ සක්‍රීය දායකත්වය තුලින් කාර්යක්ෂම මහජන සේවාවක් නිර්මාණය
- විවිධ වූ සමාජ ආර්ථික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම,අධීක්ෂණය හා කළමණාකරනය
- සංස්කෘතික විශ්වසනීයත්යව, විවිධත්වය හා සමානාත්මතාවය සදහා පෙළඹවීම
- කොට්යාස අතර සන්නිවේදනය හා සහයෝගීතාවය වර්ධනය තුලින් රාජ්‍ය ප්‍රතිපත්ති කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම

1.3 ප්‍රධාන කාර්යයන්

- රජයේ කාර්යභාරය ඉටුකිරීම සදහා අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය.
- මධ්‍යම රජයේ හා පළාත් සභා වෙනුවෙන් අනුමත ආදායම් රැස්කිරීම
- දිස්ත්‍රික්කයේ සියළු ප්‍රාදේශිය ලේකම් කාර්යාල අධීක්ෂණය, සම්බන්ධීකරණය හා පාලනය
- අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු සහ පළාත් සභා වලට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම
- විමධ්‍යගත අරමුදල් හා අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ලැබෙන අරමුදල් යොදා ගනිමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය,ආගමික හා සංස්කෘතික උත්සව හා ක්‍රියාකාරකම් දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය ආයතන,සිවිල් සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය තුලින් සමාජ ගැටළු විසදීම සදහා මැදිහත්වීම

1.4 සංවිධාන සටහන


දිස්ත්‍රික් ලේකම්
අධ්‍යක්ෂ සැලසුම්
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
සංවර්ධන නිළධාරි
කළමනාකරණ සේවා නිළධාරි
රියදුරු
කාර්යාල කාර්ය සහයක
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සංවර්ධන නිළධාරි
කළමනාකරණ සේවා නිළධාරි
කාර්යාල කාර්ය සහයක
ප්‍රධාන ගණකාධිකාරි
ගණකාධිකාරි
අයවැය සහකාර
සංවර්ධන නිළධාරි
කළමනාකරණ සේවා නිළධාරි
කාර්යාල කාර්ය සහයක
අතිරේක දිස්ත්‍රික් ලේකම්
සහකාර දිස්ත්‍රික් ලේකම්
සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක
පරිපාලන නිළධාරි
භාෂා පරිවර්තක
සංවර්ධන නිළධාරි හා විමර්ශන නිළධාරි
තොරතුරු තාක්ෂණ නිළධාරි
තොරතුරු තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිළධාරි
රියදුරු
කාර්යාල කාර්ය සහයක
අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)
සහකාර අධ්‍යක්ෂ (ආපදා)
සහකාර අධ්‍යක්ෂ (කුඩා ව්‍යාපාර)
ක්ෂේත්‍ර නිළධාරි
කළමනාකරණ සේවා නිළධාරි
කාර්යාල කාර්ය සහයක
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරු
සංවර්ධන නිළධාරි
කළමනාකරණ සේවා නිලධාරි
රියදුරු
කාර්යාල කාර්ය සහයක
දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ (පොහොර ලේකම් කාර්යාලය)
සංවර්ධන නිළධාරි
කළමනාකරණ සේවා නිළධාරි
රියදුරු
කාර්යාල කාර්ය සහයක
දිස්ත්‍රික් ඉංජිනේරු
තාක්ෂණ නිළධාරි
තාක්ෂණ සහකාර
සැලසුම් ශිල්පී
සංවර්ධන නිළධාරි
කළමනාකරණ සේවා නිළධාරි
කාර්යාල කාර්ය සහයක

1.5 දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල



ප්‍රාදේශි ලේකම් කොට්ඨාශ අනුව භූමි ප්‍රමාණය		
ප්‍රාදේශි ලේකම් කොට්ඨාශ	භූමි ප්‍රමාණය (වර්ග කිලෝමීටර්)	ප්‍රතිශතය
කොත්මලේ	225.0	12.92%
හගුරන්කෙත	229.0	13.15%
වලපනේ	320.0	18.38%
නුවරඑළිය	478.0	27.46%
අඹගමුව	489.0	28.09%
එකතුව	1741.0	100.0%
මූලාශ්‍රය -දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය, නුවරඑළිය		

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ,අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1.1 විශේෂ ජයග්‍රහණ

01. ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය 2020 සඳහා කුසලතා සම්මානයක් දිනා ගැනීමට හැකිවීම.

02. සියළු අංශවල සහයෝගයෙන් දිස්ත්‍රික්කය තුල එන්නත්කරන ක්‍රියාවලිය තුලින් සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වීම හා බූස්ටර් එන්නත් මාත්‍රාව ලබා දීම සම්බන්ධයෙන් දිවයිනේ දිස්ත්‍රික්ක අතරින් තුන්වන ස්ථානයට පත්වීම.

03. එළවළු මිල අනවශ්‍ය පරිදි ඉහල යෑම වැලැක්වීම සඳහා ස්වදේශ කටයුතු අමාතයාංශය,කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව "සහන්එළිය" ව්‍යාපෘතිය ආරම්භ කර සාධාරණ මිලකට එළවළු මල්ලක් ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට හැකිවීම.

04. දිස්ත්‍රික්කය තුල උප ප්‍රාදේශිය ලේකම් කාර්යාල 4ක කටයුතු ආරම්භ කර සපයන සේවාවන් මහජනතාව වෙත වඩාත් සමීප කිරීමට කටයුතු කිරීම.

2.1.2 අභියෝග

01. ස්වභාවික ආපදා බහුල වීම.

02. සංවර්ධන කටයුතු සඳහා රජයේ ඉඩම්වල පවතින හිඟය.

03. දිස්ත්‍රික් හා ප්‍රාදේශිය රාජකාරී සඳහා ප්‍රමාණවත් හොඳ තත්වයේ වාහන හිඟය.

04. සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය.

2.1.3 ඉදිරි ඉලක්ක

01. දිස්ත්‍රික් සංචාරක ප්‍රවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

02. දිස්ත්‍රික්කය තුල 2022 වර්ෂය තුල කෝපි පැල ලක්ෂ 10ක් සිටුවීම.

03.අපනයනය ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

04."නුවරඑළිය වසන්තය" වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක සාමාන්‍ය වැඩසටහන්වලට අමතරව නව වැඩසටහන් 20ක් ආරම්භ කර 2025 වන විට අවසන් කිරීම.

05. දිස්ත්‍රික් සංවර්ධනය වේගවත් කරීම හා ජනතා සුභසාධනය ඉලක්ක කරගත් සෞඛ්‍ය,කෘෂිකර්ම,සංචාරක ආදි ප්‍රධාන ක්ෂේත්‍රයන් ඇතුලත් ඒකාබද්ධ තුන් අවුරුදු උපක්‍රමික සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.

06. කාර්යාල කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම හා කඩදාසි භාවිතය අවම කිරීම.

ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ.නන්දන,
දිස්ත්‍රික් ලේකම් /දිසාපති.
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය

ජී. කේ. ජී. ඒ. ආර්. පී. කේ. නන්දන
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය.

12

03 පරිච්ඡේදය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		3,226,936,878	3,472,547,700	ඒසීඒ-3
-	තැන්පතු		150,302,881	427,378,027	ඒසීඒ-4
42,000,000	අත්තිකාරම් ගිණුම්		38,229,085	31,522,597	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		3,415,468,844	3,931,448,324	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		3,415,468,844	3,931,448,324	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		83,000,000	83,038,199	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		3,332,468,844	3,848,410,125	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
494,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	473,186,386	469,546,050	
462,890,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	363,834,101	54,238,710	ඒසීඒ-2(ii)
2,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,883,781	2,036,339	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
960,090,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		838,904,268	525,821,099	
	මූලධන වියදම්				
16,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	16,364,708	8,904,563	
11,200,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	10,154,209	10,978,349	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-		
1,800,000	හැකියා වර්ධනය	14	1,415,645	857,331	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
29,500,000	මුළු මූලධන වියදම් (උ)		27,934,562	20,740,243	
	තැන්පතු ගෙවීම්		292,284,902	392,126,990	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		44,735,876	32,180,353	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-		
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		337,020,778	424,307,343	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,203,859,608	970,868,685	
989,590,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		2,128,609,236	2,877,541,440	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		2,127,708,358	2,876,640,562	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		900,878	900,878	ඒසීඒ-3
			2,128,609,236	2,877,541,440	

1

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ෂ 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,500,149,390	2,384,812,588
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	108,181,899	101,675,109
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	900,878	900,878
මුළු වත්කම්		**2,609,232,167**	**2,487,388,575**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(157,299,512)	(305,788,324)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,500,149,390	2,384,812,588
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	265,481,411	407,463,432
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	900,878	900,878
මුළු වගකීම්		**2,609,232,167**	**2,487,388,575**

පිටු අංක 01 සිට 24 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..25.... සිට ...40.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම : පී. ඒ. ඩී. දමයන්ති
දිනය : 2022-02-21	දිනය : 17 2 2022	දිනය : 2022.02.17
ඩබ්.එච්.එම්. චිත්‍රානන්ද	ජ. කේ. ජ. ඒ. ආර්. ජී. කේ. නන්දන	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ලේකම්	දිස්ත්‍රික් ලේකම් / දිසාපති	නුවරඑළිය.
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය.	

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	120,919,158	183,378,554
අග්‍රිම ලැබීම්	3,178,036,000	3,472,547,700
අත්තිකාරම් අයකර ගැනීම්	50,601,742	39,453,400
තැන්පතු ලැබීම්	150,331,831	427,015,863
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,499,888,731**	**4,122,395,517**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	836,987,727	523,691,550
සහනාධාර සහ මාරුකිරීම්	1,883,781	2,036,339
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,578,387,654	1,461,178,330
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	35,000,000	84,109,430
අත්තිකාරම් ගෙවීම්	66,801,148	44,642,848
තැන්පතු ගෙවීම්	292,347,902	392,136,488
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,811,408,211**	**2,507,794,985**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**688,480,520**	**1,614,600,532**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	215,925	262,605
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**215,925**	**262,605**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	688,696,445	1,618,140,214
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**688,696,445**	**1,618,140,214**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(688,480,520)**	**(1,617,877,609)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**(3,277,077)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	(3,277,077)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**900,878**	**4,177,955**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**900,878**	**900,878**

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.4 ගිණුම්කරන සටහන්

ඒසීඒ-2(ii)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය**

රු.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ඉද්ධ බලපෑම		
	මූල්‍ය කරණ සංකේත අංකය	චාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+	මුළු ඉද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොකට අනුව වියදම (5)	මු.වෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
පුනරාවර්තන වියදම්											
වැඩසටහන (1) 01/01/00/											
සටහන - 5 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ											
පුද්ගල පඩිනඩි											
1001 වැටුප් හා වේතන	11	329,000,000			329,000,000	320,313,147		320,313,147	8,686,853	2.64	
1002 අතිකාල හා නිවාඩු දින වැටුප්	11	9,000,000		2,109,000	11,109,000	11,105,223		11,105,223	3,777	0.03	
1003 වෙනත් දීමනා	11	141,000,000			141,000,000 -	127,336,573	32,760	127,369,333 -	13,630,667 -	9.67	පුරප්පාඩුවූ තනතුරු සම්පූර්ණ නොවීම.
සටහන - 6 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා								-	-		
ගමන් වියදම්					-			-	-		
1101 දේශීය	11	15,700,000		(1,179,000)	14,521,000 -	14,398,683		14,398,683 -	122,317 -	0.84	
1102 විදේශීය											
එකතුව (අ)		**494,700,000**	-	**930,000**	**495,630,000**	**473,153,626**	**32,760**	**473,186,386**	**22,443,614**	**4.53**	

ඒසීඒ-2(ii)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය**

රු.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ඉද්ධ බලපෑම		
	මූල්‍ය කරණ සංකේත අංකය	චාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+	මුළු ඉද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොකට අනුව වියදම (5)	මු.වෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
සැපයීම්					-			-	-		
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	11	11,200,000			11,200,000	11,199,956		11,199,956	44	0.00	
1202 ඉන්ධන	11	5,000,000		(500,000)	4,500,000	4,499,757		4,499,757	243	0.01	
1203 ආහාර පාන හා නිල ඇඳුම්	11	1,200,000			1,200,000	1,199,197		1,199,197	804	0.07	
1204 වෛද්‍ය සැපයීම්					-			-	-		
1205 වෙනත්					-			-	-		
එකතුව (ආ)		**17,400,000**	-	**(500,000)**	**16,900,000**	**16,898,909**	-	**16,898,909**	**1,091**	**0.01**	
නඩත්තු වියදම්					-			-	-		
1301 වාහන	11	7,800,000			7,800,000	7,783,453		7,783,453	16,547	0.21	
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	11	3,700,000		(280,000)	3,420,000	3,264,042		3,264,042	155,958	4.56	
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11	6,400,000		400,000	6,800,000	6,797,735		6,797,735	2,265	0.03	
එකතුව (ඇ)		**17,900,000**	-	**120,000**	**18,020,000**	**17,845,229**	-	**17,845,229**	**174,771**	**0.97**	

ඒසීඒ-2(ii)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

පෑ.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
	මුල්‍ය කරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.ගෙ. 66/69 මාරු කිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.ගෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දරූ වියදම් (භාණ්ඩාගාර මුදිත සටහන්	මුළු වියදම්			
		(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4)*100	
සේවා					-			-	-		
1401 ප්‍රවාහන	11	150,000			150,000	125,675		125,675	24,325	16.22	අවශ්‍යතා අඩු වීම
1402 කැපැල් හා සන්නිවේදන	11	5,000,000		(150,000)	4,850,000	4,847,708		4,847,708	2,292	0.05	
1403 විදුලිය හා ජලය	11	5,200,000		(400,000)	4,800,000	4,280,709		4,280,709	519,291	10.82	Covid 19 වසංගත තත්වය හේතුවෙන් කාර්යාලයේ අවම සේවකයන් පමණක් කැඳවීම නිසා.
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	11	750,000			750,000	696,136		696,136	53,864	7.18	වරිපනම සම්මාලෝචනයෙන් ගෙවිය යුතු මුදල අඩු වීම.
1406 කල්බදු වාහන සඳහා පොලී ගෙවීම්					-			-	-		
1408 මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම්					-			-	-		
1409 වෙනත්	11	18,200,000			18,200,000	18,199,021		18,199,021	979	0.01	
එකතුව (ආ)		**29,300,000**	-	**(550,000)**	**28,750,000**	**28,149,249**	-	**28,149,249**	**600,751**	**2.09**	
අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)		**559,300,000**	-	-	**559,300,000**	**536,047,013**	**32,760**	**536,079,773**	**23,220,227**	**4.15**	

ඒසීඒ-2(ii)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

පෑ.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
	මුල්‍ය කරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.ගෙ. 66/69 මාරු කිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.ගෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දරූ වියදම් (භාණ්ඩාගාර මුදිත සටහන්	මුළු වියදම්			
		(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4)*100	
සටහන - 7 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර					-			-	-		
මාරුකිරීම්					-			-	-		
1501 සුභසාධන වැඩසටහන්	11		398,290,000		398,290,000	300,940,714		300,940,714	97,349,286	24.44	අංක PPTF/3-2021-(ii)වක්‍රලේඛයේ ඇතුලත් නිර්නායක මත අඩු අදායම්ලාභීන්ට පමණක් ගෙවීම් කිරීම
1502 විශ්‍රාමික ප්‍රතිලාභ					-			-	-		
1503 රාජ්‍ය ආයතන					-			-	-		
1504 සංවර්ධන සහනාධාර					-			-	-		
1505 සම්මාදම් සහ දායක මුදල්					-			-	-		
1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී	11	2,500,000			2,500,000	1,883,781		1,883,781	616,219	24.65	දේපල ණය අඩුවෙන් ලබාගැනීම
1507 පළාත් සභා සඳහා ප්‍රදානයන්					-			-	-		
1508 වෙනත්					-			-	-		
1509 රාජ්‍ය ආයතන (වෙනත් මෙහෙයුම් වියදම්)					-			-	-		
එකතුව		**2,500,000**	**398,290,000**	-	**400,790,000**	**302,824,495**	-	**302,824,495**	**97,965,505**	**24.44**	

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය**

පැ.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ඉද්ධ බලපෑම		
	මූල්‍ය කරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+	මුළු ඉද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොකට අනුව වියදම (5)	මු.ගෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුදිත සටහන් (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
සටහන - 8 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද පොළී ගෙවීම්					-			-	-		
1601 දේශීය ණය සඳහා පොලී ගෙවීම්					-			-	-		
1602 විදේශීය ණය සඳහා පොලී ගෙවීම්					-			-	-		
1603 භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්					-			-	-		
එකතුව					-			-	-		
1701 පාඩු සහ කපාහැරීම්					-			-	-		
1702 අනපේක්ෂිත සේවා					-			-	-		
1703 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම					-			-	-		
එකතුව					-			-	-		
වැඩසටහන (1)					-			-	-		
මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9)		**561,800,000**	**398,290,000**	**-**	**960,090,000**	**838,871,508**	**32,760**	**838,904,268**	**121,185,732**	**28.59**	

ඒසිඒ-2(ii)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

පැ.

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ඉද්ධ බලපෑම		
	මූල්‍ය කරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.ගෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+	මුළු ඉද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොකට අනුව වියදම (5)	මු.ගෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුදිත සටහන් (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
මූලධන වියදම්					-			-	-		
වැඩසටහන (1)					-			-	-		
වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය					-			-	-		
සටහන - 10 මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්					-			-	-		
2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11	11,500,000			11,500,000	11,498,219		11,498,219	1,781	0.02	
2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	11	1,000,000			1,000,000	877,750		877,750	122,250	12.23	අප්‍රවැඩියා අවශ්‍යතා අඩුවෙන් යෙදීම
2003 වාහන	11	4,000,000			4,000,000	3,988,739		3,988,739	11,261	0.28	
එකතුව (අ)		**16,500,000**	**-**	**-**	**16,500,000**	**16,364,708**	**-**	**16,364,708**	**135,292**	**0.82**	
සටහන - 11 මූලධන වත්කම් අත්පත් කර ගැනීම්					-			-	-		
2101 වාහන					-			-	-		
2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	11	3,000,000			3,000,000	2,914,974		2,914,974	85,026	2.83	
2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	11	3,200,000			3,200,000	3,195,068		3,195,068	4,932	0.15	
2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11	5,000,000			5,000,000	4,044,166		4,044,166	955,834	19.12	පැවති ගොඩනැගිලි දුව්‍ය ගිහිගකම නිසා ඉදි කිරීම් ප්‍රමාද වීම.
2105 ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම්					-			-	-		
2106 මෘදුකාංග සංවර්ධනය					-			-	-		
2108 කල්බදු වාහන සඳහා ණය මුදල් ආපසු ගෙවීම්					-			-	-		
එකතුව (ආ)		**11,200,000**	**-**	**-**	**11,200,000**	**10,154,209**	**-**	**10,154,209**	**1,045,791**	**9.34**	

ඒසීඒ-2(ii)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය**

රු.

විෂය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ශුද්ධ බලපෑම		
	මූල්‍ය කරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.අ.ප. 66/69 මාරු කිරීම (3) (-)/+	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොකට අනුව වියදම (5)	මු.අ.ප. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම්) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
සටහන -12 ප්‍රාග්ධන මාරුකිරීම්					-			-	-		
2201 රාජ්‍ය ආයතන					-			-	-		
2202 සංවර්ධන සහායන්					-			-	-		
2203 පළාත් සභා සඳහා ප්‍රදානයන්					-			-	-		
2204 විදේශයන්ට මාරු කිරීම					-			-	-		
2205 රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන්					-			-	-		
එකතුව (ඇ)					-			-	-		
සටහන - 13 මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම					-			-	-		
2301 හිමිකම් දායක මුදල්					-			-	-		
2302 ණයදීම්					-			-	-		
එකතුව (ඇ)					-			-	-		
සටහන - 14 හැකියා වර්ධනය					-			-	-		
2401 කාර්ය මණ්ඩල ප්‍රහුණු	11	1,800,000			1,800,000	1,415,645		1,415,645	384,355	21.35	රටේ පැවති වසංගත තත්වය හේතුවෙන් නිළධාරී ඒකරාශි කිරීම් අඩුවෙන් යෙදීම.
එකතුව (ඉ)		**1,800,000**	-	-	**1,800,000**	**1,415,645**		**1,415,645**	**384,355**	**21.35**	

ඒසීඒ-2(ii)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 260 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

විෂය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ශුද්ධ බලපෑම		
	මූල්‍ය කරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.අ.ප. 66/69 මාරු කිරීම (3) (-)/+	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොකට අනුව වියදම (5)	මු.අ.ප. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම්) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
සටහන - 15 වෙනත් මූලධන වියදම්					-			-	-		
2501 ප්‍රතිව්‍යුහගතකිරීම්					-			-	-		
2502 ආයෝජන					-			-	-		
2503 අනපේක්ෂිත සේවා					-			-	-		
2504 පළාත් සභා සඳහා දායකත්වය					-			-	-		
2505 ප්‍රසම්පාදන පෙර සූදානම් වීම්					-			-	-		
2506 යටිතල පහසුකම් සංවර්ධනය					-			-	-		
2507 පර්යේෂණ සහ සංවර්ධන					-			-	-		
2509 වෙනත්					-			-	-		
එකතුව (ඊ)					-			-	-		
වැඩසටහන (1)					-				-		
රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ)		**29,500,000**	-	-	**29,500,000**	**27,934,562**	-	**27,934,562**	**1,565,438**	**5.31**	
